# SMALL
# &
# MEDIUM SCALE BUSINESSES
# (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීම සඳහා ජාතික මෙන්ම ජාත්‍යන්තර වශයෙන් විවිධ නිර්ණායක භාවිත කරයි. එම නිර්ණායක පදනම් වී ඇත්තේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සාධක මත ය.

## ප්‍රමාණාත්මක සාධක

ප්‍රමාණාත්මක සාධක වශයෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක ව ගණනය කළ හැකි සාධක ය.

**නිදසුන් :**

ආයෝජිත ප්‍රාග්ධන ප්‍රමාණය, යොදා ගන්නා සේවක සංඛ්‍යාව, භාවිතයට ගන්නා බල ශක්තිය, වාර්ෂික පිරිවැටුම

## ගුණාත්මක සාධක

ගුණාත්මක සාධක යන්නෙන් අදහස් කරන්නේ සංඛ්‍යාත්මක වශයෙන් මැනිය නො හැකි සාධක ය.

**නිදසුන් :**

ව්‍යාපාර සංවිධාන ක්‍රමය, භාවිත කරන තාක්ෂණය, වෙළෙඳපොළ ස්වභාවය

ClassWork.LK

# දේශීය හා ජාත්‍යන්තර වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඉදිරිපත් කර ඇති විවිධ නිර්වචන

ස්වාධීන ව අයිති හා ස්වාධීන ව ක්‍රියාත්මක වන එසේ ම ක්ෂේත්‍රය තුළබලයක් හිමි නො වූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ.

ඇමරිකා එක්සත් ජනපදයේ ස්මෝල් බිස්නස් ඇඩ්මිනිස්ට්‍රේෂන් ආයතනය (Small Business Administration Institute - USA )

ClassWork.LK

# ක්‍ෂුද්‍ර ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ ආයතන භාවිත කරන විවිධ නිර්ණායක

| ආයතනය | නිර්ණායකය |
| --- | --- |
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | 1. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 2. කාර්මික තාක්ෂණික ආයතනය | 2. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 3. යොදවා ඇති ප්‍රාග්ධනය රුපියල් මිලියන 4 නො ඉක්මවන ව්‍යාපාර |
| 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 4. ආයෝජිත ප්‍රාග්ධනය රුපියල් මිලියන 20 නො ඉක්මවන ව්‍යාපාර |
| 5. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | 5. සේවක සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර |
| 6. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 6. ස්ථිර සේවක සංඛ්‍යාව 50 ට අඩු ව්‍යාපාර |
| 7. ශ්‍රී ලංකා මහ බැංකුව | 7. භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පිටර් 50 ට අඩු ව්‍යාපාර |

Class Work.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ලක්ෂණ

- වෙළෙඳපොළ කුඩා වීම
- ආයෝජිත ප්‍රාග්ධනය කුඩා වීම
- සේවක සංඛ්‍යාව අඩු වීම
- පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම
- තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදු වීම
- ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීන වීම හා බොහෝ විට අයිතිකරු ප්‍රධාන කළමනාකරු වීම
- වෙළෙඳපොළ බොහෝ විට දේශීය වීම (නමුත් සමහර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විදේශීය වෙළෙඳපොළට ද නිෂ්පාදිත සපයයි.)
- විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මුල්‍ය බැඳීම් අඩු වීම
- නවීන තාක්ෂණය භාවිතය අඩු වීම

ClassWork.LK

# රටක ආර්ථික සංවර්ධනයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය

- මෙම ව්‍යාපාර ශ්‍රම සුක්ෂම කර්මාන්ත නිසා වැඩි රැකියා ප්‍රමාණයක් සැපයිය හැකි වීම

- ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම

- දේශීය සම්පත් භාවිත කිරීම

- ප්‍රාදේශීය සංවර්ධනය හේතුවෙන් නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම

- ආදායම් ව්‍යාප්තියේ විෂමතා අවම වීම

- මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිමිද්‍රව්‍ය ලබා දීම

- මහා පරිමාණ ව්‍යාපාර ඉටු නො කරන ව්‍යාපාර කටයුතුවල නිරත වීම

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යාමේ දී සැලකිළිමත් විය යුතු කරුණු

- තම හැකියා හා කුසලතා පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා ඇගැයීම
- නිෂ්පාදිතයට ඇති වෙළෙඳපොළ හා එම වෙළෙඳපොළට ළගාවිය හැකි ද යන්න
- ආරම්භක ප්‍රාග්ධනය හා අවශ්‍ය කාරක ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය කිරීම
- ව්‍යාපාර සංවිධාන ක්‍රමය පිළිබඳ ව අධ්‍යයනය
- ව්‍යාපාර සංවිධාන ක්‍රමය හා පවතින නීති රීති
- පවතින තරගකාරිත්වය

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට හෝ අසාර්ථක වීමට බලපා ඇති විවිධ හේතු

## සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාර්ථක වීමට බලපා ඇති හේතු

- ප්‍රමාණවත් යටිතල පහසුකම් තිබීම
- මූල්‍ය හා බදු සහන වැනි දිරිගැන්වීම්
- පුළුල් වෙළෙඳපොළක් පැවතීම
- විවිධ ආයතනික හා අලෙවි පහසුකම් ලබා දීම
- දක්ෂ කළමනාකරණයක් තිබීම
- ව්‍යාපාරිකයින්ගේ උනන්දුව හා කැපවීම

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු

- මූල්‍ය ගැටලු
- වෙළෙඳපොළ තරගකාරිත්වයට මුහුණ දීමට අපහසු වීම
- කළමනාකරණයේ දුර්වලතා
- ව්‍යවසායකත්ව හැකියා අඩු වීම
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නො වීම
- නව තාක්ෂණික දැනුම අඩුකම හා නව තාක්ෂණය යොදා නො ගැනීම

ClassWork.LK

# සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ව්‍යවසායකත්වය වැදගත් වීමට හේතු


- ව්‍යාපාර ඇරඹීම අවදානම් සහගත වීම, එහෙත් ව්‍යවසායකයා තුළ ඇති අවදානම් කළමනාකරණය කිරීමේ හැකියාව තුළින් එය අවම කර ගත හැකි ය.

- ව්‍යවසායකයාගේ කැපවීම හා උනන්දුව මත බොහෝ දුරට ව්‍යාපාරය සාර්ථක වේ.

- ව්‍යවසායකයා තුළ ඇති ආත්ම විශ්වාසය හා අධිෂ්ඨානය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපායි.

- එසේ ම ව්‍යවසායකයා තුළ ඇති ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමට කටයුතු කිරීමෙන් ව්‍යාපාර සාර්ථක කර ගත හැකි වේ.

ClassWork.LK


පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
BUSINESS
STUDIES
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු 27
ලියාපදිංචි වීමට :-
076 36 55 550
ඉරිදා
උදෑසන 11.00
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura